# සංස්කෘතික තේජස

ඕනෑම ජන සමාජයක අක්මුල් සොයා ගවේෂණයක යෙදෙන අයෙකුට එම ප්‍රදේශයට අනන්‍ය වූ සංස්කෘතික වපසරිය විමසීම අතිශය වැදගත් වේ. ඒ අනුව කෑගලු දිසාවෙහි මුල් අවධියේ සිට පැලපදියම් වී ඇති ඇදහිලි හා විශ්වාසයන් මෙන්ම ඒවා හා බැඳුණු පූජා විධි රටා ,පූජා කර්ම ,නර්තන ලීලාවන් හා චිත්‍ර මූර්ති ආදිය සොයා බැලීම සංස්කෘතිකමය වශයෙන් බොහෝ තතු හෙළිදරව් වීමකි.උඩරට නර්තන සම්ප්‍රදායේ කෝෂ්ඨාගාරය ලෙස සැලකෙන කොහොඹාකංකාරියෙහි උපත හා පැවැත්ම පිළිබඳව ඓතිහාසික තොරතුරු රැසක් සතර කෝරළයට අයත් බව ප්‍රත්‍යක්ෂමාන වේ. එනිසාම දේශීය නර්තනය හා ශාන්තිකර්ම යන විෂයද්වය පිළිබඳ තොරතුරු විමසීමේදී කෑගලු පුරයට ප්‍රමුඛ ස්ථානයක් හිමිවේ. එනයින් පාරම්පරික නර්තන ශිල්පී පරපුරවල් ගණනාවක් අද්‍යතනයේත් ස්වකීය පාරම්පරික උරුමය සුරකිමින් සංස්කෘතිකමය මෙහෙවරක යෙදෙති. ඒ අතර දීවෙල ,උඩගම , මාකූර ,මුද්ධනාව ,දෙවනගල ,දෙහිමඩුව ,හාල් මැස්ස ,හේරත්ගම ,අල්ගම ,ගල්අතර ,එලමල්දෙනිය ,කොටවැල්ල ,බුදවත්ත හා හිග්ගොඩ ආදී නර්තන ශිල්පි පරපුරවල් දැක්විය හැක.

පාරම්පරික නර්තන කලාවට මතු නොව සකල විධ කලා ශිල්ප වලින් පරිපූර්ණ කෑගලු දිසාව චිත්‍ර මූර්ති හා කැටයම් ආදී කලාවන්ට සුපතලය. සතර කෝරලය එකම කෞතුක මධ්‍යස්ථායක් බවට හැඳින්විය හැක්කේ දෙවනගල ,වාකිරිගල ,දනකිරිගල ,දැදිගම ,අම්බුළුගල ,කෑලෑ දඹුල්ල ,සැලව ,යටහලෙන ,කරඬුලෙන ,ලෙනගල ආදී පෞරාණික වූත් ඓතිහාසික වූත් පූජනීය ස්ථානවල ඇති චිත්‍ර ,මූර්ති හා කැටයම් මේ දක්වා ශේෂිත වීඇති නිසාමය. දහඅටවන සියවසේ ඇති වූ සංස්කෘතික පුනර්ජීවනය හා සබැඳි සිත්තර පරපුරට අයත් දෙවරගම්පල සිල්වත්තැන සතර කෝරළය තුළ සුජීවත්ව විසූවෙකි.  අද්විතීය දෙවරගම්පල සිල්වත් තැනගේ කලා පරපුර හැරුණුකොට නීලවල පරපුර (මංගලගම කලා පරපුර) ,මැදගොඩ මහදූර ගෙදර සිත්තර පරපුර ,වේකොළදෙණිය කලා පරපුර කලාකෙත අස්වැද්දීම වස් විසල් මෙහෙවරක නියුතු වූවෝය. කලා කෙත දිග් විජය කළ කලාකරුවෝ රැසක් ජාතියට තිළිණ කළ පුරවරයක් ලෙස කෑගල්ල සුපතලය. අයිරාංගනී සේරසිංහ ,සුමින්ද සිරිසේන ,එඩ්වඩ් ජයකොඩි ,නන්දා මීගස්තැන්න ,රුකාන්ත ගුණතිලක ,රාජු බණ්ඩාර ,අශෝක හඳගම ,දුලීකා මාරපන ,ඩේසි මුණසිංහ ,ආරියවංශ රණවීර ආදී කලාකරුවෝ මේ අතරින් කිහිපදෙනෙකි.

